**වැලිගම ප්‍රාදේශීය සභාව**

**මාතර දිස්ත්‍රික්කය**

**-------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 24 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 17 දින (සංශෝධිත) විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 26 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට වැලිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.1,166,494 කින් වැඩියෙන් දැක්වුණි.

(ආ) අතහැර දමා තිබූ කර්මාන්ත දෙකක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.3,527,930 ක ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන සළසා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී කොටවිල පෙර පාසලක වැසිකිළිය ඉදිකිරීම වෙනුවෙන් දරා තිබූ රු.267,223 ක වියදම් ප්‍රාග්ධනිත කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන සැලසීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු පොලී ආදායම් රු.250,589 කින් අඩුවෙන් දැක්වුණි.

(ඉ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 15 ක වටිනාකම තක්සේරු කර, ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

### 1.3.2 අවිනිශ්චිත ගිණුම

නිරවුල් කිරීමට පියවර නොගෙන දිගින් දිගටම ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පවතින අවිනිශ්චිත ගිණුමේ වූ රු.65,791 ක බැර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට කටයුතු නොකර 2015 වර්ෂයේදී සමුච්චිත අරමුදල් ගිණුමට ලියා හැර තිබුණි.

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.34,008,683 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය තුළ, වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.3,466,307 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.1,360,575 ක් වූ විවිධ ණයහිමි ශේෂය තුළ, වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.206,587 ක ශේෂ 06ක් ඇතුළත් වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.825,680 ක් වූ වැට්බදු තැන්පතු සහ කර්මාන්ත රුඳවුම් ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.78,680,944 ක් වූ ඉඩම් හා ගොඩනැඟිලි සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තාද, එකතුව රු.8,651,483 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන හා විධිමත් පරිදි පවත්වන ලද ස්ථාවර වත්කම් ලේඛණයද, රු.80,742 ක්වූ ඉතිරි කිරීමේ තැන්පත් සම්බන්ධයෙන් ශේෂ සනාථද, යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වගන්තිය පරිදි 1998 වර්ෂයේ සිට සිදු කර තිබුණු ඉදිකිරීම් වෙනුවෙන් වරිපනම් බදු ගෙවන පාරිභෝගිකයන් 3585 දෙනෙකුගේ දේපළ තක්සේරු කර, නව තක්සේරු වටිනාකම් යටතේ වරිපනම් අය කර නොතිබුණි.

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 අනුව රු. 21,197 ක්වූ අගරු චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.56,379,299 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.31,513,647 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.24,865,652 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 වරිපනම් හා බදු

(අ) වරිපනම්

ආරම්භක හිඟය රු.954,967 ක් වූ අතර, රු.288,416 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.1,243,383 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.204,271 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.1,039,112 ක් හිඟව පැවතුණි.

(ආ) අක්කර බදු

ආරම්භක හිඟය රු.123,433 ක් වූ අතර, රු.11,316 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.134,749 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.4,828 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.129,921 ක් හිඟව පැවතුණි.

#### 2.2.2 බදු කුලී

ආරම්භක හිඟය රු.958,401 ක් වූ අතර, රු.2,892,127 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.3,850,528 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.3,262,431 ක් වූ බැවින්, වර්ෂය අවසානයට රු.588,097 ක් හිඟව පැවතුණි.

#### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.5,209,614 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.78,567,039 ක් ලැබිය යුතුව තිබුණි.

## 2.3 අධිභාර
--------
සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලදී මා විසින් නිකුත් කර තිබුණු එකතුව රු.7,750,286 ක් වූ අධිභාර සහතික 10 ක් සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අවධානයට යොමුකර නොතිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

## 3.1 කාර්යසාධනය
----------------

### 3.1.1 ප්‍රාග්ධන වැඩ යෝජනා ඉටුකිරීමේ ප්‍රගතිය
---------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම රු.46,380,000 ක් වූ නමුත්, තථ්‍ය ප්‍රාග්ධන වියදම රු.19,361,915 ක් හෙවත් ඇස්තමේන්තුගත අගයෙන් සියයට 42 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව විවිධ ප්‍රතිපාදන සහ සභා අරමුදල් යටතේ රු.14,625,000 ක් වූ වැඩ යෝජනා 27 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, වර්ෂය තුළ රු.500,000 ක් වූ එක් කර්මාන්තයක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ රු.1,950,000 ක් වූ වැඩ යෝජනා 04 ක් අනුමත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළ එකදු කර්මාන්තයක් හෝ ඉටු කර නොතිබුණි. සභාවට ලැබී තිබූ රු.1,000,000 ක මුදල ජංගම ගිණුමක රඳවා තිබූ අතර, වැඩ යෝජනා ක්‍රියාත්මක නොකිරීම නිසා සභාවට ලැබිය යුතු රු.950,000 ක මුදලක් ලබාදීම පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සහ අනෙකුත් වැඩසටහන් යටතේ ඉකුත් වර්ෂ 02 ට අදාළව ප්‍රතිපාදන ලැබී තිබුණු රු.2,504,835 ක් වූ කර්මාන්ත 04 ක සහ සමාලෝචිත වර්ෂයේ ගිවිසුම් අත්සන් කර තිබූ රු.2,700,000 ක් වූ කර්මාන්තයක වැඩ 2017 අගෝස්තු 02 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ඉටුකිරීමට ඇස්තමේන්තු කළ වටිනාකම රු.5,092,041 ක් වූ කර්මාන්ත 03 ක ඉටු කළ වැඩ වටිනාකම රු.3,168,827 ක් වූයෙන් එම කර්මාන්තවල මූල්‍ය ප්‍රගතිය ඇස්තමේන්තුගත හා තථ්‍ය වටිනාකම් සියයට 47 සිට සියයට 79 දක්වා පරාසයක විය.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) විධිමත් අනුමැතියකින් තොරව සභාව විසින් බඳවා ගෙන තිබුණු සේවකයින්ගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු.5,313,836 ක වියදම් දැරීමට සිදුවී තිබුණ අතර, අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 11 ක් පුරවා ගැනීමට හා 55 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ණය ශේෂය රු.6,453,232 ක් වූ අතර, එකී ශේෂය තුළ වාරික සහ පොලී අය නොවන රු.117,349 ක් වූ ශේෂ 03 ක් ඇතුළත්වී තිබුණි.

## 3.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජන වත්කම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේදී රු.1,166,494 ක් වැයකර ඉදිකර තිබුණු වොලිබෝල් ක්‍රීඩාංගණය 2017 අගෝස්තු 04 දින විටත් නිෂ්කාර්යව පැවතුණි.

(ආ) සභාවේ ගලිබවුසරය සමාලෝචිත වර්ෂය ආරම්භයේ සිටම නිෂ්ක්‍රීයව පැවති අතර අළුත්වැඩියා කටයුතු සඳහා මිලදී ගෙන තිබූ රු.391,715 ක අමතර කොටස් තොගයද 2017 අගෝස්තු 04 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන පැවතුණි.

## 3.4 හඳුනාගත් අලාභ

නාගරික සංවර්ධන අධිකාරියේ 1992 සැප්තැම්බර් 30 දිනැති අංක 5/2/2/10(ii) දරන චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් කට්ටිකර විකිණීමේදී පොදු පහසුකම් සඳහා එම විකුණන ඉඩමේ ප්‍රමාණයෙන් සියයට 10 ක ප්‍රමාණයක් සභාවට හිමිවිය යුතු වුවද එලෙස ලැබිය යුතු අක්කර 12 රූඩ් 03 පර්චස් 0.26 ක ඉඩම් ප්‍රමාණයක් සභාවට අහිමි වී තිබුණි.

## 3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් 2016 වර්ෂය තුළ කසළ කලමනාකරණය වෙනුවෙන් රු.11,870,262 ක වියදම් දරා තිබූ නමුත් එකතු කරනු ලබන කසළ බැහැර කිරීම සඳහා ස්ථිර ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් ඝන අපද්‍රව්‍ය ටොන් 3057 ක් එකතු කර තිබුණ අතර, ඉන් කිසිඳු ආදායමක් උපයාගෙන නොතිබුණි. එමෙන්ම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ව්‍යාපාර බදු ගෙවන හෝටල් 358 ක ප්‍රමාණයක් තිබූ අතර, ඒවායින් කසළ එකතු කිරීම සඳහා ගාස්තු අයකිරීමට අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි.

## 3.6 පාරිසරික බලපෑම
--------------------

2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය මගින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදිය යුතු කර්මාන්ත 25 ක් හඳුන්වාදී තිබූ අතර, ව්‍යාපාර බදු ගෙවනු ලබන ආයතන 322 කින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගැනීම නිසා සභාවට රු.1,416,800 ක ආදායම් අහිමි වී තිබුණි. එමගින් පරිසරයට සිදුවන අහිතකර බලපෑමට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

# 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
---------------------------------------.

## 4.1 අයවැය පාලනය
------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. වියදම් විෂයයන් 08 ක එකතුව රු.27,042,557 ක් වූ ඉතිරිවීම් ද, ආදායම් විෂයයන් 04 ක ළඟාකර හොත් ඉලක්කයන්ගේ එකතුව රු.11,917,594 ක් ද පැවතිව තිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණ අතර, සභාව විසින් පත් කර තිබූ අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී රු.438,630 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් රැස්කිරීම

(ඈ) වත්කම් කළමනාකරණය කිරීම